**<u>මහජනතාව වෙත කෙරෙන දැනුම්දීමයි</u>**

**ශ්‍රී ලංකාවේ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ ප්‍රතිසංස්කරණ පිළිබඳව මහජන අදහස් කැඳවීම**

මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමේ අවශ්‍යතාව සැළකිල්ලට ගෙන, 1951 මුස්ලිම් විවාහ සහ දික්කසාද (සංශෝධිත) පනතේ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මහජනතාවගෙන් අදහස්/යෝජනා විමසා, සලකා බැලීම සඳහා ගරු අධිකරණ අමාත්‍යතුමා, මුස්ලිම් නීති ප්‍රතිසංස්කරණ උපදේශක කමිටුවට බලය පවරා ඇත. අනෙකුත් කරුණු අතර, කමිටුවේ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් සහ මෙම විෂය පිළිබඳ පෙර වාර්තා සහ/හෝ ලිඛිත යෝජනා කිහිපයක් සැලකිල්ලට ගනිමින් පහත සඳහන් කරුණුවලට අදාළ ප්‍රතිසංස්කරණ සඳහා යෝජනා දැනටමත් ඉදිරිපත් කර ඇත.

- විවාහය අනිවාර්යයෙන් ලියාපදිංචි කිරීම හඳුන්වාදීම,
- විවාහය සඳහා මනාලිය අත්සන් තැබීම සහ එකඟතාව ප්‍රකාශ කිරීම,
- එක් පාර්ශවයක් පමණක් ශ්‍රී ලාංකික වුව ද, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත යටතේ විවාහයට අවසර ලබා දීම, පූර්ව විවාහ ගිවිසුම් පිළිගැනීම,
- විවාහ වන අවස්ථාවේ දී/දික්කසාද වන අවස්ථාවේ දී හුවමාරු වන දැවැද්ද සහ වෙනත් යම් මුදල් ගනුදෙනු හෝ දේපළ සාධාරණ ලෙස අයකර ගැනීමට පහසුකම් සැලසීම,
- දික්කසාද වන අවස්ථාවේ දී, විවාහය අතරතුර අත්පත් කරගත් දේපළ සාධාරණ ලෙස බෙදා හැරීම,
- අන්‍යොන්‍ය කැමැත්ත මත දික්කසාදය පිළිගැනීම,
- දික්කසාද නඩු කටයුතුවල දී දරුවන්ගේ අයිතිවාසිකම්වලට ප්‍රමුඛත්වය ලබා දීම.
- “මහර්” (දීමනාව) (Mata’a (alimony)) සම්බන්ධයෙන් වන නියෝග සඳහා විධිවිධාන සැලසීම,
- නඩත්තුව පිළිබඳ නියෝග නිකුත් කිරීමේ දී ඇති සියලුම විෂමතා ඉවත් කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණ වෙත සාධාරණ නඩත්තු වියදම් සහ නඩත්තු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නිර්නායක හඳුන්වා දීම,

1951 මුස්ලිම් විවාහ සහ දික්කසාද (සංශෝධිත) පනතේ ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස්/යෝජනා, කමිටුව සාදරයෙන් පිලිගන්නා අතර, විශේෂයෙන්ම, පහත වෙබ් අඩවියේ නිශ්චිතව දක්වා ඇති ක්ෂේත්‍ර පහ පිළිබඳ මහජන අදහස්/යෝජනා ඉදිරිපත් කරන ලෙස කමිටුව ඉල්ලා සිටියි. සියලුම මහජන අදහස්/යෝජනා **<u>2026.03.01</u>** දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

වැඩිදුරටත් උපදෙස් සඳහා සහ ඔබගේ නිරීක්ෂණ/අදහස්/යෝජනා ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වෙබ් අඩවිය www.moj.gov.lk වෙත පිවිසෙන්න.

තොරතුරු ඉදිරිපත් කිරීමේ දී කරුණාකර ලියුම් කවරයේ වම් පස “ශ්‍රී ලංකාවේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ ප්‍රතිසංස්කරණ පිලිබඳව මහජන අදහස් කැඳවීම” යනුවෙන් පැහැදිලිව සළකුණු කර පහත දක්වා ඇති ලිපිනයට එවිය යුතුය. නැතහොත් ඔබගේ අදහස් විද්‍යුත් තැපැල හරහා legal@moj.gov.lk වෙත යොමු කළ හැකිය.

**ලේකම්**

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

**නො. 19, ශ්‍රී සංඝරාජ මාවත**

**කොළඹ 10**

ලේකම්

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය